**ශීර්ෂය 207 - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියලුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියලු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 207 - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.15 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ගණන්දීමේ නිලධාරීගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි.<br>2. ලේඛන හා පොත් පවත්වා නොතිබීම.<br>3. අභ්‍යන්තර විගණනයේ වූ අඩුපාඩු.<br>4. සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය නොකිරීම | 2.2.1<br>2.12<br>2.13<br>2.8 |
| 128(1)(ආ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2. 9 |
| 128(1)(ඇ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාපනය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශනය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශනය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.4 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඉ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව (මෙහිලා අරපිරිමැස්ම යනුවෙන් අදහස් කෙරෙන්නේ හුදෙක් ඇස්තමේන්තුමත වියදම් දැරීම නොව, වියදම් කරනු ලබන මුදල දරනා රජයට උපරිම වටිනාකම ලැබෙන බවට සහතික කිරීම) | 1. ප්‍රමාණවත් ලෙස ඉටු නොකල ප්‍රධාන කාර්යයන්<br>2. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම<br>3. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | 2.2.2 (අ),(ආ)<br>2.2.2 (ඇ)<br>2.2.2(ඇ) |
| 128 (1)(එ) | නිලධාරීන්ගේ/ සේවකයන්ගේ ප්‍රමාදය, නොසැලකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්යය පරිපාටිය ගණන් දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරන ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/ සේවකයන් මත අධිභාර පනවනු ලබන බව | 1. පාඩු හා හානි<br>2. රජයේ නිලධාරීන්ට ඇප තැබීම. | 2.6<br>2.15 |

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**2.1 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයන්**

- ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය හඳුනා ගැනීම.
- ශ්‍රී ලංකාවේ චංචල හා නිශ්චල පුරාවිද්‍යාත්මක උරුමය ලේඛනගත කිරීම.
- පුරාවිද්‍යාත්මක උරුමය විනයානුකූලව සංරක්ෂණය කිරීම, නඩත්තු කර පවත්වාගෙන යාම සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
- පුරාවිද්‍යාත්මක අඥාපනත ක්‍රියාත්මක කිරීම.
- සංස්කෘතික දේපල පනත ක්‍රියාත්මක කිරීම.
- පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක මහජනයා වෙත ඉදිරිපත් කිරීම.
- විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු ස්ථානවලට සිදුවන හානිය පිළිබඳ හානි ඇගයුම් සමීක්ෂණ කටයුතු කිරීම.

## 2.2 කාර්යසාධනය

-----------------

### 2.2.1 සැලැසුම් කිරීම

-----------------

අපේක්ෂිත ප්‍රධාන කාර්යයන් ඉටු කෙරෙන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. මධ්‍යම සංස්කෘතික අරමුදලින් පුරාවිද්‍යා සංරක්ෂණ කාර්යයන් සඳහා ලැබෙන අරමුදල් වලින් අපේක්ෂිත ඉලක්ක ළගා කිරීම පිළිබඳව පිළියෙළ කර තිබුණු ක්‍රියාකාරී සැලසුමේ ඇතුළත් කර නොතිබුණි.

### 2.2.2 කාර්යභාරයන් ඉටු නොකිරිම

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

---------------------------------------------------

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වන ශ්‍රී ලංකාවේ චංචල හා නිශ්චල පුරාවිද්‍යාත්මක උරුමයන් ලේඛන ගත කිරීම යන ප්‍රධාන කාර්යය නිසි පරිදි ඉටු වී නොතිබුණු බව පහත කරුණු අනුව අනාවරණය විය.

(i) මාතලේ ඓතිහාසික මැක්ඩොවල් බලකොටුව පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරකයක් ලෙස ලියාපදිංචි කිරීම සඳහා 2013 ජනවාරි 31 වන දින නියෝජ්‍ය අධ්‍යක්ෂ (මධ්‍යම) විසින් ප්‍රධාන කාර්යාලය වෙත වාර්තාවක් ඉදිරිපත් කර තිබුණද 2017 වර්ෂය අවසන් වන විටත් මෙය ආරක්ෂිත ස්මාරක ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

(ii) පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරකයක් වශයෙන් ප්‍රකාශයට පත් කළ යුතු යැයි දෙපාර්තමේන්තුව තීරණය කර ඇති වාස්තු විද්‍යාත්මක වශයෙන් ඇගයීමට ලක්වන වසර 130 ක් පැරණි කොම්පඤ්ඤවීදියේ සොයිසා ගොඩනැගිල්ල 2018 වර්ෂය වන විටත් ආරක්ෂිත ස්මාරකයක් ලෙස ලියාපදිංචි කර නොතිබුණි. වර්තමානයේ මෙම ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමේ තර්ජනයකට ලක්ව තිබුණි.

**(ආ) පුරාවිද්‍යා භූමි ගැසට් නොකිරීම, අනවසරයෙන් අත්පත් කර ගැනීම, හානි වීම**

----------------------------------------------------------------------------------

පුරාවිද්‍යා භූමි ගැසට් නොකිරීම, අනවසරයෙන් අත්පත් කර ගැනීම, හානි වීම සම්බන්ධයෙන් පළාත් 8 කින් ලබා ගත් තොරතුරු පහත දැක්වේ.

| පළාත/දිස්ත්‍රික්කය | සීමා ලකුණු කර මායිම් කණු සිටුවා නොමැති පුරාවිද්‍යා ස්ථාන ප්‍රමාණය | ලේඛනගත කිරීම් නොමැති පුරාවිද්‍යා ස්ථාන ප්‍රමාණය | ගැසට් නොකළ පුරාවිද්‍යා ස්ථාන | ගවේෂණය නොකළ පුරාවිද්‍යා ස්ථාන | අනවසර පදිංචිවීම් වාර්තාවන පුරාවිද්‍යා ස්ථාන | පුරාවිද්‍යා ස්මාරක වලට හානි සිදුවීම | මෙතෙක් ගවේෂණය සිදු කර නැති හඳුනාගත් පුරාවිද්‍යා රක්ෂිත |
| --- | --- | --- | --- | --- | --- | --- | --- |
| <u>උතුර</u> | | | | | | | |
| යාපනය | 79 | - | 15 | - | 03 | 01 | - |
| කිලිනොච්චිය | 18 | 15 | 15 | 15 | - | - | - |
| මන්නාරම | 18 | - | - | - | 02 | 02 | - |
| <u>නැගෙනහිර</u> | | | | | | | |
| මඩකලපුව | - | 05 | 05 | 05 | - | 05 | - |
| අම්පාර | - | - | - | - | 25 | 22 | 186 |
| <u>උතුරු මැද</u> | | | | | | | |
| අනුරාධපුරය | 38 | - | 03 | - | 04 | 25 | - |
| <u>මධ්‍යම</u> | | | | | | | |
| මහනුවර | 06 | - | - | - | 03 | - | - |
| නුවරඑළිය | 05 | - | - | - | - | - | - |
| මාතලේ | 25 | - | - | 02 | 05 | - | - |
| <u>දකුණ</u> | | | | | | | |
| හම්බන්තොට | 11 | 01 | - | 11 | 06 | 07 | - |
| ගාල්ල | - | - | - | - | 21 | 02 | - |
| මාතර | - | - | - | - | - | 04 | - |
| <u>ඌව</u> | | | | | | | |
| මොණරාගල | 29 | 16 | 16 | 09 | 22 | 09 | - |
| <u>වයඹ</u> | | | | | | | |
| පුත්තලම | 02 | - | - | 02 | 04 | - | - |
| කුරුණෑගල | 10 | - | - | - | 13 | 15 | - |
| <u>සබරගමුව</u> | | | | | | | |
| රත්නපුරය | 18 | - | - | 06 | 11 | - | - |
| එකතුව | <u>259</u> | <u>37</u> | <u>54</u> | <u>50</u> | <u>119</u> | <u>92</u> | <u>186</u> |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). පුරාවිද්‍යා ස්ථාන 259 සීමා මායිම් ලකුණු කර මායිම් කණු යොදා නොමැති බව නිරීක්ෂණය වූ අතර යාපනය දිස්ත්‍රික්කයේ පමණක් එම සංඛ්‍යාව 79 ක් පමණ විය.

(ii). ලේඛනගත නොකළ පුරාවිද්‍යා ස්ථාන 37 ක් වාර්තා වී තිබුණු අතර ගැසට් නොකළ පුරාවිද්‍යා ස්ථාන 54 ක් පමණ විය.

(iii). ගවේෂණය නොකළ පුරාවිද්‍යා ස්ථාන 50 ක ප්‍රමාණයක් පවතින බව අනාවරණය වූ අතර අනවසර පදිංචිවීම් නිසා පුරාවිද්‍යා රක්ෂිත හා පුරාවිද්‍යා ස්මාරක 119 ක් හානි වී තිබුණු බව වාර්ථා වී තිබුණි. අනවසර වගා කටයුතු , අනවසර ඉදිකිරීම්, අනවසර පදිංචිවීම් ආදිය මේ සඳහා හේතු වී තිබුණි. කෙසේ වෙතත් ඒ එක් එක් අවස්ථාවන්හි නීතිමය ක්‍රියා මාර්ග ගෙන තිබුණි.

(iv). පුරාවිද්‍යා ස්ථානවල නිදන් සොරුන් විසින් කරනු ලබන නීති විරෝධී කැණීම් කටයුතු , ගොඩනැගිලි ඉදිකිරීම් සහ ගල්වලවල් පවත්වා ගෙනයාම වැනි කටයුතු වලින් පුරාවිද්‍යා ස්ථාන 92 ක් පමණ විනාශ වී තිබුණ ද එම තත්ත්වය පාලනය කිරීම සඳහා ප්‍රමාණවත් පියවරගෙන නොතිබුණි.

(v). පුරාවිද්‍යා ස්ථාන ලෙස හඳුනා ගෙන ඇති නමුත් රක්ෂිත හා ස්මාරක ලෙස ලියාපදිංචි නොකළ හා මායිම් කණු යොදා නැති පුරාවිද්‍යාත්මක ස්ථාන 186 ක් පමණ අම්පාර දිස්ත්‍රික්කයේ පවතින බව වාර්තා වී තිබුණි. මෙම ස්ථාන රක්ෂිත කණු දමා ගැසට් මගින් පුරාවිද්‍යා ස්ථාන ලෙස ගැසට් කිරීමට ඉලක්ක ගත සැලසුම් සකස් කර නොතිබුණි.

(vi). දෙපාර්තමේන්තුව සතුව පවතින කාර්ය මණ්ඩලයෙන් පුරාවිද්‍යා ස්මාරක හා පුරාවිද්‍යා රක්ෂිත ආරක්ෂාවට යෙදවිය හැකි සේවකයන් ප්‍රමාණවත් නොවන බැවින් සිවිල් ආරක්ෂක භටයන් 200 ක් යෙදවීමට තීරණය කර තිබුණද බස්නාහිර පළාත සහ තවත් දිස්ත්‍රික්ක 06 ක් සඳහා 105 දෙනෙක් පමණක් යොදවා තිබුණි.

(vii). පොළොන්නරුව සහ වව්නියා දිස්ත්‍රික්ක වලට අදාළ පුරාවිද්‍යා භූමිවල අනවසර පදිංචිවීම් 12 ක් පමණ ඇති බව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් වාර්තා කර තිබුණි.

**(ඇ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

---

(i) 2017 වර්ෂයේදී රු.29,272,045 ක ප්‍රතිපාදන වෙන් කරමින් විශේෂ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරන ලද මඩකලපු දිස්ත්‍රික් ගවේෂණ ව්‍යාපෘතියේදී පුරාවිද්‍යා ස්ථාන 648 ක් හඳුනාගෙන තිබූ අතර එම ස්ථාන, එම ව්‍යාපෘතියේ අරමුණ වූ හඳුනාගත් පුරාවිද්‍යා ස්ථාන, ස්මාරක සහ රක්ෂිත භූමි ලෙස ප්‍රකාශයට පත් කොට මායිම් කණු යොදා සුරක්ෂිත කිරීමේ කාර්යය 2018 සැප්තැම්බර් වන විටත් සිදු කර නොතිබුණි.

(ii) 2016 වර්ෂයේදී ගවේෂණය කරන ලද පුරාවිද්‍යා ස්ථාන 26 ක ලැයිස්තුවක් පුරාවිද්‍යා අඥාපනත යටතේ පුරාවිද්‍යා ස්ථාන ලෙස ප්‍රකාශ කරන බවත් ඒ සම්බන්ධයෙන් විරෝධතා ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් 2017 මාර්තු 20 දින අංක 2011/06 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර තිබුණි. එහෙත් විරෝධතා ඉදිරිපත් නොවී තිබීයදීත්, 2017 සැප්තැම්බර් 15 දින සියලු නිවැරදි කිරීම් වලින් පසුව ගැසට් කිරීම

සඳහා අමාත්‍යවරයාගේ අත්සනට ඉදිරිපත් කර තිබුණද, 2018 සැප්තැම්බර් වන විටත් එම කාර්යය සම්පූර්ණ කර ගැනීමට අපොහොසත්ව තිබුණි.

**(ඈ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

-------------------------------

(i) කුණ්ඩසාලේ සංචාරක බංගලාවේ වහලයේ කොටසක් දැඩි ලෙස දිරාපත්ව ඇති බැවින් එය අලුත්වැඩියා කර ගැනීම හා නඩත්තු කිරීමේ කටයුතු වෙනුවෙන් 2017 වර්ෂයේදී රු.මිලියන 2.5 ක මුදලක් වෙන්කර තිබුණද, ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සිදු වී තිබූ අඩුපාඩු හේතුවෙන් 2017 වර්ෂයේදී මෙම අලුත්වැඩියාව සිදු කිරීමට නොහැකිව තිබුණි.

(ii) කැළණි බිතු සිතුවම් ග්‍රන්ථය මුද්‍රණය කිරීම සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් රු.මිලියන 8 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද 2017 අප්‍රේල් මස අවසන් කිරීමට සැලසුම් කර තිබූ මෙම ව්‍යාපෘතිය 2018 සැප්තැම්බර් වන විටද අවසන් කර නොතිබුණි.

**(ඉ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

-----------------------------------------------------------------

(i) රිටිගල පුරාවිද්‍යා කාර්යාල ගොඩනැගිල්ලක් සඳහා 2016 දෙසැම්බර් 31 දින රු.මිලියන 10 ක ප්‍රතිපාදන ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට ලබා දී තිබුණද 2018 අගෝස්තු මස අවසන් වන විටද කිසිදු ප්‍රගතියක් ලබා නොතිබුණි.

(ii) 2016 වර්ෂයේ සැලසුම් කළ ඉහත කාර්යය ඉටු නොවීම හේතුවෙන් 2017 වර්ෂයේදී රිටිගල පුරාවිද්‍යා ව්‍යාපෘතීන් සඳහා වෙන්කර තිබූ රු.මිලියන 4.5 ක අයවැය ප්‍රතිපාදනයෙන්ද අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමට නොහැකි වී තිබුණි.

**2.2.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 සැප්තැම්බර් 12 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**2.2.4 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම**

---------------------------------------------

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව දෙපාර්තමේන්තුව විසින් තම විෂයපථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

**2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම**

---------------------------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබා ගත යුතු වු රු. මිලියන 16.7 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 14.9 ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන1.7 ක් හෙවත් සියයට 10 ක් ඉතිරි වී නොතිබුණි.

**2.4 වත්කම් කළමනාකරණය**

--------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වත්කම් ලේඛනගත කිරිම**

----------------------------

(i) ජංගම නොවන වත්කම් සංචලන වාර්තාව පිළියෙල කිරීමේදී එක් වැය විෂයයක් යටතේ සිදු කර තිබූ රු.35,085,398 ක ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම් හා කෙරීගෙන යන වැඩ ඇතුළත් කර නොතිබුණි.

(ii) වර්ෂ ගණනාවක සිටම ආයෝජන යටතේ වන මූලධන වත්කම් අත්පත් කර ගැනීම් ඇතුළත් කර නොතිබුණි. එබැවින් ජංගම නොවන වත්කම් සංචලන වාර්තාව මඟින් නිවැරදි වත්කම් පෙන්නුම් නොකරන බව නිරීක්ෂණය විය.

(iii) 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබූ වත්කම් සම්බන්ධයෙන් වූ වාර්තාවට 2003 හා 2004 වර්ෂවලදී මිලදී ගෙන තිබූ යතුරුපැදි 56 ක් පිළිබඳ විස්තර ඇතුළත් කර නොතිබුණි.

**(ආ) වාහන උපයෝජනය**

-----------------------

(i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව සියලුම වාහනවල ඉන්ධන දහනය වීම් පරීක්ෂා කළ යුතු වුවත් ධාවනයේ යොදවා තිබූ වාහන 38 කින් වාහන 28 ක ඉන්ධන දහනය වීම් පරීක්ෂා කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන භාර නිලධාරීන් විසින් තමන් භාරයේ ඇති මෝටර් වාහන පිළිබඳව ඒ ඒ වාහනයේ වර්ගය, මෝස්තරය, ලියාපදිංචි කිරීමේ අංකය, රියදුරන්ට භාර දුන් හෝ පැවරූ දිනයන් ආදී විස්තර දැක්වෙන ලැයිස්තුවක් තබා ගෙන නොතිබුණි.

(iii) මුදල් රෙගුලාසි 802(3) ප්‍රකාරව වාහන මිලට ගත් දිනය, මිල, පුරාවෘත්තය, විටින් විට කළ අලුත්වැඩියාවන්, ඒ සඳහා ගිය වියදම, නිෂ්කාර්යව පවත්නා කාලය, නීතිපතා පරීක්ෂණ, සේවාකරණය සහ නඩත්තුව සඳහා දිනයන්ද, ඒ වෙනුවෙන් වියදම් කිසිවක්

දැරුවේ නම් ඒවාද එහි සඳහන් කළ යුතු වුවත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් එලෙස තොරතුරු ලේඛනයක වාර්තා කර නොතිබුණි.

(iv) මුදල් රෙගුලාසි 1646 අනුව මාසික සාරාංශ සහ දෛනික ධාවන සටහන් සෑම මසක් අවසන් වීමෙන් පසුව ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත එවිය යුතු වුවත්, එකී උපදෙස් අනුගමනය කර නොතිබුණි.

(v) මුදල් රෙගුලාසි 1645(අ) ප්‍රකාරව ක්‍රමවත් ලෙස සහ විධිමත් ලෙස වාහන ලොග් සටහන් පොත් පවත්වා ගෙන යා යුතු වුවත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව එලෙස ලොග් පොත් විධිමත්ව නඩත්තු කර නොතිබුණි.

(vi) 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ලාංඡනය යෙදිය යුතු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

**(ඇ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

(i) සමාලෝචිත වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව සතු වාහන 7 ක් ධාවනයේ යොදවා නොමැති බව නිරීක්ෂණය විය.

(ii) දෙපර්තමේන්තු පරිශ්‍රය තුළ 2018 සැප්තැම්බර් 16 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී යතුරු පැදි 4 ක් ප්‍රධාන කාර්යාල භූමියේ දිරා පත් වෙමින් පවතින බව නිරීක්ෂණය විය.

## 2.5 බැදීම් හා බැරකම්

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 28 දිනැති අංක 05/2016 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2 ඡේදය මගින් ලබා දී තිබු උපදෙස් අනුව වියදම් කළමනාකරණය නොකිරීම නිසා පුනරාවර්තන වැය විෂයයන් 19 ක් යටතේ ඉතිරිය ඉක්මවා රු.7,433,730 ක බැරකම්වලට බැඳී තිබුණි.

(ආ) වියදම් පාලනය නිසා ප්‍රතිපාදන ඉතිරිවන බව දක්වා ගමන් වියදම් වැය විෂයය යටතේ වැඩසටහන 1 හා 2 න් පිළිවෙලින් රු.1,832,510 ක් හා රු.1,304,300 ක් වෙනත් පුනරාවර්තන වැය විෂයයන්ට මාරු කර තිබුණද වර්ෂය අවසානයේදී ප්‍රතිපාදන නොමැති වීම නිසා ගමන් වියදම් සඳහා රු.1,723,191 ක බැරකම් ඇති වී තිබුණි.

## 2.6 පාඩු හා හානි

මුදල් රෙගුලාසි 110 වගන්තිය ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා තිබුණ ද, එය යාවත්කලීන කර නොතිබුණි. රු.830,993 ක් වූ වාහන අනතුරු 5 ක් පිළිබඳව තොරතුරු කිසිවක් එම ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

## 2.7 විසඳා නොතිබුණු විගණන ඡේද

දෙපාර්තමේන්තුවට අදාළව 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණු

ඡේදවලට යොමුව පහත දැක්වේ.

| **විගණකාධිපති වාර්තාවට යොමුව** | **යොමුගත විෂයය** |
|---|---|
| **ඡේද අංකය** | |
| (අ) 3.2 ඡේදය | 1998 අංක 24 දරණ පුරාවස්තු (සංශෝදනය) ආඥා පනතෙහි 16 (1) වගන්තිය ප්‍රකාරව පුරාවිද්‍යා ස්ථාන ලෙස හඳුනාගෙන තිබෙන රජමහා විහාර හා පුරාණ විහාරවල තොරතුරු ඉදිරිපත් කර නොතිබීම. |
| (ආ) 3.3.2. ඡේදය | මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් ලැබෙන මුදල් පුරාවිද්‍යා කාර්යයන් සඳහා යෙදවීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ඇති කිරීම. |
| (ඇ) 3.8 (ඇ) | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය යාවත්කාලීන නොකිරීම. |
| (ඈ) 3.09 (අ) ඡේදය | දඹුල්ල ලෙන් විහාර සංරක්ෂණය සඳහා 2014 වර්ෂයේදී ලබා දී තිබූ ප්‍රතිපාදන උපයෝජනය කරමින් අවසන් කළ යුතු වුවද 2017 දෙසැම්බර් 31 දින වන විටත් වැඩ අවසන් කර නොතිබීම. |

## 2.8 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරිම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| **වර්ෂය** | **වියදම් වර්ගය** | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|---|
| | | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| 2013 | පුනරාවර්තන | 572.75 | 571.68 | 1.07 | 0.18 |
| | මූලධන | 172.45 | 123.97 | 48.48 | 28.11 |
| | **එකතුව** | **745.20** | **695.65** | **49.55** | **6.65** |
| 2014 | පුනරාවර්තන | 662.55 | 659.90 | 2.65 | 0.40 |
| | මූලධන | 168.29 | 154.84 | 13.45 | 7.99 |
| | **එකතුව** | **830.84** | **814.74** | **16.10** | **1.94** |
| 2015 | පුනරාවර්තන | 849.50 | 824.88 | 24.62 | 2.90 |
| | මූලධන | 151.50 | 86.07 | 65.43 | 43.19 |
| | **එකතුව** | **1001.00** | **910.95** | **90.05** | **9.00** |
| 2016 | පුනරාවර්තන | 873.49 | 872.15 | 1.34 | 0.15 |
| | මූලධන | 165.50 | 130.51 | 34.99 | 21.14 |
| | **එකතුව** | **1038.99** | **1002.66** | **36.33** | **3.50** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2017 | පුනරාවර්තන | 892.70 | 891.93 | 0.77 | 0.09 |
| | මුලධන | 66.10 | 50.58 | 15.52 | 23.48 |
| | **එකතුව** | **958.80** | **942.51** | **16.29** | **1.70** |

**සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරිම**

**---------------------------------------------------------**

2017 වර්ෂයේදී වැය විෂයයන් දෙකක් සඳහා සලසා තිබුණු රු.මිලියන 4.5 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමනින්ම ඉතිර කර තිබුණි.

**2.9 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**----------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**----------------------------------------------**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 20701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 45 | 40.7 | 30 | 34.8 | 150 | 104.5 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.4,401,933 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂයක සිට වර්ෂ 16 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(ආ) දැනට දෙපාර්තමේන්තුවේ සේවයේ නොමැති නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු වසර 1ට වැඩි රු. 186,719 ක් වූ ආපදා ණය ශේෂ 2 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මින් එක් නිලධාරියෙක් සේවයෙන් මුදාහැර තිබූ නිලධාරියෙකු බවත් මුදාහැරීම අනුමත කිරීමේදී ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.8 වගන්තිය අනුව ආපදා ණය ශේෂය අයකර ගැනීම පිළිබඳව අවධානය යොමුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට වැඩ තහනම් කළ නිලධාරීන්ගේ ණය ශේෂය රු. 672,214 ක් වූ අතර ඉන් සියයට 88 ක් එනම් රු. 595,982 ක් අවු 5 ක් ඉක්ම වූ ශේෂයන් බව නිරීක්ෂණය විය.

**2.10 පොදු තැන්පත් ගිණුම**

------------------------

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 02 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 232 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දින වන විට දිවයින පුරා පුරාවිද්‍යා සංරක්ෂණ කාර්යයන් වෙනුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලෙන්, වාර්මාර්ග දෙපාර්තමේන්තුවෙන්, රජයේ වෙනත් ආයතන වලින් හා පුද්ගලයන්ගෙන් ලැබී එම කාර්යයන් නිම නොකිරීම නිසා පොදු තැන්පත් ගිණුමෙහි රඳවා තිබූ ලැබීම්වල වටිනාකම රු.මිලියන 229.19 ක් වූ අතර එහි ඇතුළත් වසර 3 ට වැඩි වටිනාකම රු.මිලියන 22.22 කි.

(ආ) ඇප තැන්පත්, රඳවා ගැනීම් හා වෙනත් ආපසු ගෙවිය යුතු තැන්පත් කිරීම්වල වටිනාකම රු.2,160,897 ක් වූ අතර එහි ඇතුළත් වසර 2 ට වැඩි ශේෂයන්ගේ වටිනාකම රු.244,439 කි.

**2.11 බැංකු ගිණුම් මෙහෙයවීම**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අක්‍රිය බැංකු ගිණුම්**

----------------------

දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලැබූ ජංගම ගිණුමක් 2017 දෙසැම්බර් 31 දින වන විට අක්‍රියව පැවැතුණි.

**(ආ) ගැලපුම් කළයුතු ශේෂ**

------------------------

දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණු බැංකු ගිණුම් 05 කට අදාළව ඉදිරිපත් කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශ පරීක්ෂා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) 2017 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් ලැබීම් වල වටිනාකම රු.2,489,855 ක් වූ අතර මාස 06 ට වැඩි අගය රු.978,266 කි.

(ii) කොළඹ ප්‍රධාන කාර්යාලයේ, මහනුවර සහ අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාල දෙකෙහි බැංකු ගිණුම්වල 2017 දෙසැම්බර් 31 දිනට ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ මාස 6 ඉක්ම වූ චෙක්පත් සංඛ්‍යාව 145 ක්වූ අතර ඒවායේ වටිනාකම රු.2,257,832 ක් විය. මෙම චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iii) උපලබ්ධි නොවූ ලැබීම් වල වටිනාකම රු.1,351,132 ක් වූ අතර එහි 2016 වර්ෂයට අදාළ අගය රු.600,237 ක් ඇතුළත්ව තිබුණි.

(iv) ඉහත (ii) හි දැක්වෙන චෙක්පත් අතරින් ප්‍රධාන කාර්යාලයට අයත් රු.410,089 ක් වටිනා චෙක්පත් 11 ක් 2018 මැයි මස 04 දින වන විටද මුදල් රෙගුලාසි 388(3) ට පටහැනිව ගනුදෙනුකරුවන් වෙත ලබා නොදී දෙපාර්තමේන්තුවේ රඳවාගෙන තිබුණි.

**2.12** **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

මුදල් රෙගුලාසි 447(1) හා මුදල් රෙගුලාසි 447(3) ප්‍රකාරව ආයතන ප්‍රධානියාට වියදම් පාලනය කළ හැකි වන පරිදි ඉතිරිව ඇති මුදල් ප්‍රමාණය දැක්වෙන ආකාරයෙන් විධිමත් ලෙස වැය ලේඛන පවත්වා නොතිබුණි.

**2.13** **අභ්‍යන්තර විගණනය**

2016 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන තනතුර පුරප්පාඩුව පැවති අතර අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන අංශය විසින් අභ්‍යන්තර විගණනය සිදු කර තිබුණි.

**2.14** **මානව සම්පත් කළමනාකරණය**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 808 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.408,493 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව | අහෝසි කිරීමට අපේක්ෂිත තනතුරු |
|---|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 53 | 12 | 41 | - | - |
| (ii) | තෘතියික මට්ටම | 56 | 31 | 25 | - | - |
| (iii) | ද්විතියික මට්ටම | 812 | 550 | 217 | - | 45 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 1569 | 1410 | 152 | - | 07 |
| (v) | අනියම්/කොන්ත්‍රාත්/ | - | 01 | - | 01 | - |
| | | 2490 | 2004 | 435 | 01 | 52 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ තනතුරු 8 ක්, කාර්මික නිලධාරි තනතුරු 16 ක් සැලසුම් ශිල්පි 01 ක් හා පුරාවිද්‍යා ප්‍රතිරූපන ශිල්පී 8 ක් පුරප්පාඩුව පවතින අතර මෙම තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටි සංශෝධනය කිරීමට ඉල්ලීම් කර තිබුණද, අනුමැතිය ලැබීමේ ප්‍රමාදය හේතුවෙන් මෙම තනතුරු පුරප්පාඩුව පැවතුණි.

(ආ) සංවර්ධන නිලධාරී 64 ක්, පුස්තකාලාධිපති තනතුරු 01 ක් තොරතුරු සන්නිවේදන තාක්ෂණ

සහකාර තනතුරු 11 ක් හා රාජ්‍ය කළමනාකරණ සහකාර තනතුරු 12 ක්ද 2015 වර්ෂයට පෙර සිට පුරප්පාඩුව පවතින අතර ඒවා පුරවන ලෙස 2015 වර්ෂයේ සිට රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය වෙත දන්වා තිබුණද පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2016 මාර්තු 18 දින වන විට කාර්මික සහකාර තනතුරු 75 ක් අනුමත වී තිබුණ ද. 2018 වර්ෂය වන විටත් බඳවා ගැනීම් සිදු කොට නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුගත තනතුරු වන නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ තනතුරු (SL-1) සඳහා සීමිත තරඟ විභාගයක් පැවැත්වීමට කටයුතු යොදා තිබියදී දෙපාර්තමේන්තුවේ MN – 04 සේවා ගණයට අයත් නිලධාරීන් පිරිසක් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පැවරීම නිසා දින නියමයන් නොමැතිව විභාගය කල් දැමීමට සිදු වී තිබුණි. එම නිසා පුරප්පාඩු පිරවීමට නොහැකිව තිබූ අතර බඳවා ගැනීමේ පරිපාටි සංශෝධනයට ඉල්ලීම් කර තිබුණි.

## 2.15 රජයේ නිලධාරීන්ට ඇප තැබීම

--------------------------------

මුදල් රෙගුලාසි 880 හි සඳහන් විධි විධාන ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තබා නොතිබුණි.